# ස්වභාවධර්මවාදය

ඩී.එස්. හසරංගිකා
එල්.ජ්.එම්. හංසනී ප්‍රමිලා උදයකුමාරි

## හැඳින්වීම

ස්වභාවධර්මවාදය යනු සියලුම සංසිද්ධීන් අත්භූත හෝ ආධ්‍යාත්මික පැහැදිලි කිරීමකින් තොරව ස්වභාවික ගුණාංග සහ හේතූන්වලින් පැන නගින බව ප්‍රකාශ කරන දෘෂ්ඨී කෝණය වේ. මෙහිදී දෙවියන් හෝ විශේෂ ශක්තින් පිළිබඳව සාක්ච්ඡා නොකර භෞතිකවාදී ලෝකය හා සම්බන්ධ වූ නීති පිළිබඳ විග්‍රහ කරනු ලැබේ. භෞතිකවාදී ලෝකය සත්‍ය ලෝකය බවත් සියලුම සංසිද්ධීන් විද්‍යාත්මක විමර්ශනයක් මගින් ඉතාම පහසුවෙන්ම හඳුනාගැනීමට හැකි බවත් ස්වභාවධර්මවාදය මගින් පෙන්වා දේ. එම නිසා ස්වභාවධර්මයට ඉහළින් අනෙකුත් කිසිඳු සත්‍යයක් නොපවතින බවට පදනම්ව වෙන් වූ දර්ශනය ස්වභාවධර්මවාදය ලෙස හැඳින්වීම විය හැකිය. ස්වභාවධර්මවාදීන්ට අනුව සියලු ගැටලුවලට අවසාන පිළිතුර වන්නේ ස්වභාවධර්මයයි. ස්වභාවධර්මවාදය යන්න 17වන සියවසේ ඇතිවූ නමුත් එය පිළිබඳව ප්‍රසිද්ධියට පත්වූයේ 19වන හා 20වන සියවස්වලදී ය. ඒ සඳහා ජෝන් ඩිවි හා ඩේවිඩ් හියුම් යන දාර්ශනිකයන්ගේ සිතුවිලි බොහෝදුරට උපකාරී වූ බව පෙනවා දිය හැක. ඒ අතරින් ඩේවිඩ් හියුම්ගේ දර්ශනය අත්භූත දෑ විශ්වාස නොකර නිරීක්ෂණ කෙරෙහි අවධාරණය යොමු කර තීරණවලට එළඹීම ස්වභාවධර්මවාදය සඳහා පදනම ලෙස සලකා ඇත (Mesiono, 2018). ජෝන් ඩිවි මෙම සංකල්පය තව දුරටත් දියුණු කර ස්වභාවධර්මවාදය අධ්‍යාපනය හා සමාජ ප්‍රතිසංස්කරණය සඳහා යොදා ගෙන ඇත. එහිදී විද්‍යාව හා මානව අත්දැකීම් මත පදනම් වූ අධ්‍යාපනයක් හා සමාජයක් ඇති කිරීම වෙනුවෙන් ජෝන් ඩිවි ක්‍රියා කර ඇත (Widodo & Anggriani,2023). කෙසේ නමුත් ස්වභාවධර්මවාදයේ ශූරයා ලෙස හඳුවන්වා දෙනු ලබන්නේ ජීන් ජැක්වස් රූසෝ වේ. එමෙන්ම ප්‍රබල දාර්ශනියකයන් රැසක් මෙම ස්වභාවධර්මවාදය පිළිබඳ විවිධ

වූ විශ්ලේෂණ රැසක් සිදු කර ඇත. උදාහරණයක් ලෙස ගත් විට ඇරිස්ටෝටල්, ඩා(ර්)වින්, ස්පෙන්සර්, තාගොර් පෙන්වා දිය හැක. මේ සියලුම දාර්ශනිකයින්ට අනුව ස්වභාවධර්මයෙන් තොර පැවැත්මක් නොමැති අතර ඕනෑම සංසිද්ධියක් විද්‍යාත්මක විශ්ලේෂණයකින් පසුව නිවැරදි නිගමනයකට එළැඹිය හැකි බවයි.

ස්වභාවධර්මවාදයේ ලක්ෂණ පිළිබඳ සලකා බැලීමෙදී ප්‍රථමයෙන්ම ස්වභාවධර්මය යනු අවසාන යථාර්ථය වේ. මෙය මිනිස් පැවැත්මට මිනිසාගේ හා සමාජයේ හැසිරීමට, පවුල හා ආර්ථිකය සම්බන්ධ පරිසරවලට ඍජුවම බලපානු ලබයි. ස්වභාධර්මවාදය පිළිබඳ විවිධ වූ දාර්ශනිකයන් හා ස්වභාවධර්මවාදීන්ගේ අදහස් සාකච්ඡා කිරීමේදී, ප්‍රථමයෙන්ම ජීන් ජැක්වස් රූසෝ යන ස්වභාවධර්මවාදියා පිළිබඳ සාකච්ඡා කළ යුතුය. ඔහු ස්වභාවධර්මවාදය ඉහළින්ම අගයන්නකි. ඔහුගේ ස්වභාවික අධ්‍යාපනය පිළිබඳ එමිල් යන ප්‍රසිද්ධ කෘතිය මඟින් මනෝවිද්‍යාත්මක අධ්‍යාපන ක්‍රමයක් ප්‍රකාශ කර ඇත. ඔහුගේ දර්ශනයට අනුව මිනිසා නිදහසේ ස්වභාවධර්මය තුළ ඉපදී ස්වභාවධර්මයේ පුරුකක් ලෙස ජීවත් වේ ය යන්නයි. මිනිසා ස්වභාවධර්මය තුළ ජීවත්වීමේ දී තමාගේ අවශ්‍යතා හඳුනාගෙන, ඔවුන්ගේ මූලික අවශ්‍යතාවලට ප්‍රමුඛස්ථානයක් ලබා දෙමින් ඔවුන් විසින් ඔවුන්වම පාලනය කරගනිමින් අන් අයගේ බලපෑමකින් තොරව නිදහසේ ජීවත් වේ යැයි රූසෝගේ අදහස වේ (Kartikasari, 2022). ඔහුට අනුව ස්වභාදහම මගින් හීන වී ගිය මානුෂීය ක්‍රියාවලි නැවත ළඟා කරගත හැකිවේ. ප්‍රබල දාර්ශනිකයෙක් වූ ඇරිස්ටොටල් ස්වභාවධර්මවාදය මැනවින් අධ්‍යයනය කර පවසා තිබෙන්නේ ලොව පවතින සෑමදෙයකටම හේතුවක් හා අරමුණක් ඇති බවයි, ස්වභාවධර්මය කිසි විටකත් කිසිවෙකුට හානියක් නොකරන බවය. ඔහුගේ දර්ශනයට අනුව ස්වභාවධර්මය සියලුම ගැටලු සඳහා පිළිතුරු සපයන අතර සෑම විටම අපට උපකාර කිරීමට සැරසී සිටින බවය. ජොන් ඩුවි යන ඇමරිකානු දාර්ශනිකයාට අනුව මානව පැවැත්ම සඳහා ස්වභාවධර්මය හා පවතින ක්‍රියාකාරකම් අත්‍යාවශ්‍ය වේ (Sebastian, 2015). මානව පැවැත්මට හා සදාචාරාත්මක තීරණ ගැනීම සඳහා ස්වභාවික ලෝකය හා ස්වභාවධර්මය මූලිකව බලපානු ලබයි. ජෝන් ඩුවීට අනුව අධ්‍යාපනයේ එකම අරමුණ දැනුම නොව ක්‍රියාව බවයි. ස්වභාදහම මගින් මිනිසාට අවශ්‍ය අධ්‍යාපනය

නිරායාසයෙන්ම සපයන බව ඔහුගේ අදහස වේ. අවසාන නිගමනය ලෙස සියලුම ස්වභාවධර්මවාදීන්ට ඔවුනොවුන්ට විවිධ වූ අදහස් දර්ශනයන් පැවතියද ඔවුන් සියල්ලම ස්වභාවික ලෝකය මානව සමාජය, ආධ්‍යාත්මික හෝ මනෝවිද්‍යාත්මක පැහැදිලි කිරීම් වලින් හා අත්භූත අදහස් වලින් තොරව ස්වභාවික ක්‍රියාවන් වලින් සමන්විත විය යුතු බව අවසානයේ දී පෙන්වා දී ඇත (Mesiono, 2018).

ස්වභාවධර්මවාදය පිළිබඳ සාකච්ඡා කරීමෙදී එය අවස්ථා කිහිපයක් භෞතික ස්වභාවධර්මවාදය, යාන්ත්‍රික ස්වභාවධර්මවාදය, ජීවවිද්‍යාත්මක ස්වභාවධර්මවාදය ලෙස හඳුනා ගත හැක. ප්‍රථමයෙන්ම භෞතික ස්වභාවධර්මවාදය පිළිබඳව සාකච්ඡා කිරීමෙදී මිනිසාගේ ජීවිතය මුළුමනින්ම පාලනය වන්නේ සහ මිනිසාගේ ජීවිතයට මුලුමනින්ම බලපානු ලබන්නේ ස්වභාදහම යන නොවෙනස් වන නීතිය මඟින් වේ. ස්වභාවදහම පිළිබඳව ප්‍රබල දාර්ශනිකයෙකු වන තාගෝර් පවසන්නේ ස්වභාවධර්මය යනු 'දෙවියන්ගේ අත්පිටපත' ලෙසයි (Mesiono, 2018). යාන්ත්‍රික ස්වභාවධර්මවාදයට අනුව කිසිදු විශේෂිත වූ ආත්මයක් හෝ අත්භූත බලයක් නොමැත. පවතින්නේ පදාර්ථය පමණක් බවයි. මෙහිදී මිනිසා හුදෙක්ම යන්ත්‍රයක් පමණක් බවත් විශේෂිත වූ ආත්මයක් හෝ වෙනත් යමක් කිසිදු සංසිද්ධියක් නොකරන බවත් පෙන්වා දේ. මෙම යාන්ත්‍රික ස්වභාවධර්මවාදයට අනුව මිනිසා යනු විශිෂ්ට ලෙස පුහුණු කළ යුතු යන්ත්‍ර වේ. එමෙන්ම එය හොඳින් ක්‍රියා කළ හැකි හොඳ තත්ත්වයේ තිබිය යුතු වේ (Sebastian, 2015). උදාහරණයක් ලෙස ගත් විට මිනිස් ශරීරය තුළ රුධිරය ගමනාගමනය කිරීම වැනි යාන්ත්‍රික ක්‍රියාවලි රැසක් පෙන්වාදිය හැක.

ජීවවිද්‍යාත්මක ස්වභාවධර්මවාදය මගින් පැහැදිලි කරනු ලබන්නේ මිනිසා වානරයාගෙන් පැවත එන බවත් කාලයත් සමග හැසිරීම් හා චර්යා රටා ක්‍රමක්‍රමයෙන් දියුණු වන බවත් වේ. මේ හේතුව නිසා මිනිසාගේ දුක සහ සතුට වෙනස් වන බව මෙයින් පෙන්වා දේ (Widodo & Anggriani,2023). එසේම මිනිසාගේ පැවැත්මේ දියුණුවක් මෙම අවස්ථාවට අනුව දැකිය හැක. උදාහරණයක් ලෙස ගත් විට පුද්ගලයෙකුට යම් ක්‍රියාවක් සිදු කිරීමට අවශ්‍ය වුවද එමගින් සමාජය පීඩාවට පත්වන්නේ නම් එම ක්‍රියාවෙන් මිදී සිටිය හැක. මෙය ජීවවිද්‍යාත්මය ස්වභාවධර්මවාදය මගින් පෙන්වා දේ.

ඉහත සඳහන් කරන ලද අවස්ථා මගින් ස්වභාවධර්මය මිනිස් ජීවිතය තුළ ඇති කරන බලපෑම පිළිබඳ මනාව පැහැදිලි වේ. ස්වභාවධර්මවාදය යන පරම සත්‍ය නොමැති වූකල සියල්ල ම තර්කානුකූල බවකින් තොර දෑ බවට පත්වේ. ස්වභාවධර්මවාදය හා අධ්‍යාපනය පිළිබඳ සාකච්ඡා කරන විට එහි මනා සබඳතාවයක් පවතින බව පැහැදිලි කර පෙන්වාදිය හැක. Syarif & Islam (2021) අනුව ස්වභාවධර්මවාදීන් සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයට පටහැනිව ක්‍රියා කරයි. ස්වභාවධර්මයෙන් මිදී පන්ති කාමරය තුළ දැඩිව සිදු කරනු ලබන අධ්‍යාපන ක්‍රමය නොව ස්වභාවධර්මය සමග සමගාමීව සිදුකරන අධ්‍යාපනය මගින් වඩා ප්‍රතිඵල අත්පත් කරගත හැකි බව ඔවුන්ගේ නිගමනය වේ (Aqidah, P., Islam, F., Ushuluddin, F., & Islam, S (2022). දරුවා ස්වභාදහමට ඇති දැඩි ඇල්ම මගින් ජීවිතයට අවශ්‍ය සියලුම කරුණු පහසුවෙන් ලබා ගැනීමට හැකි බව ස්වභාවධර්මවාදින්ගේ අදහස වේ. මෙහිදී ශිෂ්‍යයාගේ නිදහස සීමා නොකර උපරිම නිදහසක් ලබා දී ශිෂ්‍ය කේන්ද්‍රී පරිසරයක් නිර්මාණය කිරීම සිදු කරනු ලබයි. ස්වභාවධර්මවාදීන්ට අනුව ශිෂ්‍යයාට පරිසරය මගින් සියල්ල අධ්‍යයනය කර ග්‍රහණය කර ගැනීමේ හැකියාව ඇත. කිසිදු ආධිපත්‍යක් ශිෂ්‍යයා කෙරෙහි ඇති නොවිය යුතු අතර ඔහුට අවශ්‍ය ආකාරයට අධ්‍යාපනය ලබා ගැනීමට පූර්ණ නිදහස ලබා දිය යුතුය. ස්වභාවධර්මවාදය හා ඊට අදාළ අධ්‍යාපනික අරමුණු පිළිබඳව සාකාච්ඡා කිරීමෙදී ස්වභාවධර්මවාදීන් විශ්වාස කරන්නේ සිසුන්ට ඔවුන්ගේ අදහස් සහ දක්ෂතා ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ලබාදිය යුතු බවයි. එමගින් සිසුන් තමන්ගේ හැකියාවන් හඳුනාගෙන ඒ ඔස්සෙ ඔවුන්ගේ ඉදිරි ජීවිතය පිළිබඳ සැලසුම් නිර්මාණය කරගත හැක. අධ්‍යාපන ක්‍රමය ඔස්සේ සිසුන්ට එම අවස්ථාවන් හඳුනාගැනීමට අවස්ථාවක් ලබා නොදෙන්නේ නම් එය සිසුවාට සිදු කරන අසාධාරණයක් බව ස්වභාවධර්මවාදීන්ගේ අදහස වේ (Kristiawan, 2016). උදාහරණයක් ලෙස ගත් කළ සිසුන් පරිසරය අධ්‍යයනය කිරීම මඟින් පරිසරයේ ඇති විවිධ ශබ්ද රසයන් හඳුනා ගැනීමට, ඒ ඔස්සේ කාව්‍ය රචනා කිරීම, අලංකාර චිත්‍ර ඇඳීම ආදී සෞන්දර්යාත්මක දක්ෂතා ඔප් නැංවේ.

තවද මිනිසාගේ ජීවිතයට විවිධ වූ ස්වයං සංරක්ෂණක අවශ්‍යතා පවතී. ස්වභාවධර්මවාදීන්ට අනුව විවිධ අවස්ථාවලදී ඇති විය හැකි

ආපදා විපත් වලින් වැලකී සිටීමට මෙම ස්වයං සංරක්ෂණ ප්‍රයෝග යෙදිය යුතුය. ස්වභාදහම සමඟ නිරතවී කටයුතු කිරීම, අධ්‍යයනය කිරීම මගින් අවස්ථාවෝචිත ප්‍රඥාව ලබාගත හැක. උදාහරණයක් ලෙස ගත් විට ගිනිසිලුවකට අත තැබූ විට පිළිස්සෙන බව දැන ගැනීම ගිනි සිලුවකට අත තැබීමෙන් පමණක්ම අවබෝධ වේ. නැතහොත් එය පොත පතින් ඉගැන්වූවත් එම අත්දැකීම නොමැතිව අවබෝධ නොවේ (Sebastian, 2015). ස්වභාවධර්මවාදීන්ගේ අදහස නම් එක් එක් දරුවා උපතේ සිටම තම තමන්ට ආවේණික වූ විශේෂිත ස්වභාමය දක්ෂතාවලින් සමන්විත බවය. එය ස්වභාවධර්ම විසින්ම ඔප්නංවන අතර අන් කිසියම් දෙයකින් එය වෙනස් නොකළ හැකි බවත් ඔවුන්ගේ අදහස වේ. යම් දරුවෙකුගේ ක්‍රීඩා කෞෂල්‍ය ස්වභාවයෙන්ම ලැබෙන්නක් වේ. එය පුහුණුව මගින් වැඩි දියුණු කළ හැකි වුවද කිසිවෙකුට එය පසු කාලිනව උකහා ගත නොහැක. තවද ස්වභාවධර්මවාදීන් පවසන්නේ පුද්ගලයෙකුට තම ජීවිතයේ දී බොහෝ වේදනාකර සහ ආතතිමය තත්ත්වයන්ට මුහුණදිය යුතු වනු ඇති බවය (Kristiawan, 2016). ඒ සඳහා පුහුණුව ස්වභාවධර්මය මගින් පමණක්ම ලබා ගත හැකි අතර ඒ ඒ අවස්ථාවට අනුව ආතතිය පාලනය කර ගැනීමට පුහුණු වන්නේ ස්වභාවධර්මය මඟිනි. ස්වභාදහම සමඟ තම ජීවිතය අපහසු අවස්ථා බෙදා ගැනීම මගින් පුද්ගලයන්ට එය මනා සහනයක් වනු ඇත.

දරුවෙකුට අධ්‍යාපනය ලබාදෙන විට, ඔහුගේ මුළු ස්වභාවය (ප්‍රවණතා, සංවර්ධන මට්ටම, හැකියාවන්, ස්වභාවමය ගුණාංග, කැමති හා අකැමති දේ) සළකා බැලිය යුතුය. එක් එක් පුද්ගලයාට සාපේක්ෂව ඔවුන්ගේ ස්වභාවමය ගුණාංග, කැමැත්ත අකමැත්ත, හැකියාවන් වෙනස් වේ. එවිට සියලුම පුද්ගලයන්ට එක ම ආකාරයෙන් අධ්‍යාපනය ලබා දීම සිදු නොවිය යුත්තකි. ඔවුනොවුන්ට ගැළපෙන ලෙස ඔවුනොන්වුන්ගේ කැමැත්ත අනුව, හැකියාව අනුව අධ්‍යාපනය ලබා දිය යුතුය. අධ්‍යාපනයේ අරමුණ විය යුත්තේ දරුවා සන්සුන්, සාමාන්‍යභාවී, තර්කශීලී, ප්‍රයෝජනවත් සහ පරිණත පුද්ගලයකු බවට පත්වීමට උපකාර කිරීමයි. ඒ සඳහා ස්වභාවධර්මය මඟින් මනා උපකාරයක් ලබා දෙන බව ස්වභාවධර්මවාදීන්ගේ මතය වේ. අධ්‍යාපනය හා ස්වභාවධර්මවාදය පිළිබඳ විවිධ වූ දාර්ශනිකයින් විවිධ වූ දාර්ශනික අදහස් රැසක් යොමු කර ඇති අතර රූසෝ ගේ දාර්ශනික අදහස් ඒ අතරින් ප්‍රමුඛස්ථානයක් ලබා ගනී.

ස්වභාවධර්මවාදය යනු ස්වභාවය සහ එහි නියමයන් අනුව ජීවිතය හා අධ්‍යාපනය පැවැත්විය යුතු බව පෙන්වා දෙන දාර්ශනික මතයකි. මෙහි ප්‍රධාන අදහස් සහ ඒවාට අදාළ උදාහරණ පැහැදිලි කළහොත්, ජීවිතය ස්වභාවික ක්‍රියාවලියක් වන නිසා අධ්‍යාපනය ද එය අනුගමනය කළ යුතුය. දරුවන්ට ඔවුන්ගේ ස්වභාවය අනුව ඉගෙනීමේ අවස්ථා ලබාදිය යුතුය. එක් එක් දරුවාට ආවේණික වූ අධ්‍යාපන ක්‍රමවේදයක් පවතී. උදාහරණයක් ලෙස ගත් විට මාරියා මොන්ටිසෝරි ගේ දර්ශනය මඟින් පෙනවා දෙන්නේ අධ්‍යාපන ක්‍රමය ශිෂ්‍යයාට උචිත ස්වභාවයෙන්ම පැවතිය යුතු බවයි. ස්වභාවදහම මඟින් ස්වභාවධර්මයේ උපකාරයෙන් යුතුව දරුවන් ඉගෙන ගත යුතු බවයි. රූසෝට අනුව සාම්ප්‍රදායික අධ්‍යාපනය මඟින් ළඳරුවන් ඉතාමත් ඉක්මනින් පීඩාකාරී සමාජ තත්ත්ව තුළට ගෙන යාමක් සිදුවන බවයි. ඔහුගේ අදහස ඒ වෙනුවට ළමුන්ට ඔවුන්ගේ ස්වභාවික සිතුවිලි සහ හැකියාවන් අනුව සීමා රහිතව ස්වභාවධර්මය සමඟ වර්ධනය වීමට ඉඩ ලබා දිය යුතු බව ය. අනවශ්‍ය සීමා යෙදීම සිදු නොකළ යුතු වේ. දරුවන්ගේ මූලික අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම සිදු විය යුත්තේ ස්වභාවධර්මය සමඟ බව රූසෝගේ දර්ශනයෙන් පෙන්වා දේ. එසේම රූසෝගේ දර්ශනයට අනුව අවුරුදු 12ට පෙර අධ්‍යාපනය විය යුත්තේ සංවේදී අත්දැකීම්, භෞතික ක්‍රියාකාරකම් සහ ප්‍රායෝගික දැනීම මත පදනම්වය, පොත් පත් මතකයේ තබා ගැනිමේ අරමුණ පසෙක තැබිය යුතුය. රූසෝගේ දර්ශනයට අනුව ඍජු උපදේශනය වෙනුවට ළමුන්ට ඔවුන් විසින්ම කරුණු දැක අධ්‍යයනය කිරිමෙ හැකියාව තිබිය යුතුය. උදාහරණයක් ලෙස ගත්විට භෞතික විද්‍යාව පිළිබඳ කියාදීම වෙනුවට ඔවුන්ට වස්තූන් අත්හදා බැලිම් කළ යුතුය. ස්වභාවධර්මය උදාහරණයට ගෙන විද්‍යාව ආදී විෂයන් ඉගැන්වීම සිදු කළ යුතු බව ඔහුගේ අදහස වේ (Aqidah, P., Islam, F., Ushuluddin, F., & Islam, S., 2022). සිසුන් සාම්ප්‍රදායික පන්ති කාමරයෙන් මිදී පිටත පරිසරය සමඟ ක්‍රියාකාරකම්වල නිරත විය යුතු බව රූසෝගේ නිගමනය වේ. ස්වභාවධර්මය තමන්ගේ හොඳම ගුරුවරයා ය යන්න රූසෝ ගේ විශ්වාසය වූ අතර එමඟින් අත්දැකීම් මත පදනම් ව ඉගෙනීමට දරුවාට හැකියාව ලැබෙනු ඇත. එමෙන්ම දැඩි අනුශාසනා ලබාදීම් වෙනුවට, ළමුන්ට තම ක්‍රියාවන් සඳහා ස්වභාවික ප්‍රතිඵල දැනගැනීමට ඉඩ දිය යුතුය. උදාහරණයක් ලෙස

ගත් විට සිසුවෙකුගේ නොසැලකිලිමත් ලෙස තම ක්‍රීඩා බඩුවක් බිඳ දැමුවහොත්, දඬුවමක් ලබා දීම වෙනුවට ඔහුට එය නැවතත් ලබාගත නොහැකි බවේ අත්දැකීම හරහා වගකීම පැවරිය යුතුය. ස්වභාවධර්මය මඟින් සිදු කරන මෙම පැහැදිලි කිරීම් සිසුන් ඉතාමත් පහසුවෙන් උකහා ගන්න බව රූසෝ වැනි දාර්ශනිකයින්ගේ අදහස වේ.

ස්වභාවධර්මවාදී ඉගැන්වීම් රටාව පිළිබඳ සාකච්ඡා කිරීමේදී ස්වභාවධර්මවාදීන් පොත්පත් ඔස්සේ අධ්‍යාපනය ලබා දීමට දැඩි සේ විරෝධතාවයක් පෙන්වා ඇත. එමෙන්ම ඉගෙනීම ක්‍රියාවන් මඟින් සිදු විය යුත්තක් බව ඔවුන්ගේ අදහස වේ. ඉගැන්වීම ස්වභාදහම, ද්‍රව්‍ය හා මිනිසා අතර සිදුවන අතර අත්දැකීම් ඒ ඔස්සේ ලබා ගැනීම මඟින් අධ්‍යාපනය ලබා දිම නිර්දේශ කරනු ලබයි. හියුරිස්ටික් ක්‍රමය භාවිත කර අධ්‍යාපනය ලබා දීම නිර්දේශ කරන අතර එමඟින් ශිෂ්‍යයා තමා විසින්ම දැනුම ලබා ගැනීම සිදු කරනු ලැබේ. එය වඩා ඵලදායි ස්වභාවධර්මවාදීන්ගේ නිගමනය වේ. එසේම පංචේන්ද්‍රියයන් ඔස්සේ දැනුම ලබා ගැනීම පිළිබඳ ස්වභාවධර්මවාදීන් පෙන්වාදේ. අධ්‍යාපනය ලැබීමට නම් පංචේන්ද්‍රියන්ගේ භාවිතය තිබිය යුතු බව දාර්ශනික අදහස වේ. එමෙන් සාර්ථක අධ්‍යාපනයක් ලබා දිය හැකි බව ඔවුන් පෙන්වා දෙයි. මේ සඳහා ඔවුන් මොන්ටිසෝරි ක්‍රමය, කින්ඩර්ගාඩ්න් ක්‍රමය හා විනෝදකාමී අධ්‍යාපන ක්‍රම භාවිත කර ඉගැනීවීම් නිර්දේශ කරනු ලබයි. ස්වභාවධර්මවාදය අධ්‍යාපනය සමඟ සාකච්ඡා කිරීමේදී ගුරුභූමිකාව පිළිබඳ සාකච්ඡා කළ යුතුය. ගුරුවරයාට සුවිශේෂ වූ කාර්යයන් රැසක් පවතී.

ගුරුවරයා සැපයුම්කරුවෙකි, දරුවන්ට පහසුකම් සපයන්නෙකි. ශිෂ්‍යයාට අධ්‍යාපනය හැදෑරීමට අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ සැපයීම ගුරුවරයා සතු වගකීමක් වේ. ස්වභාවධර්මවාදයට අනුව ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් පැවතීම හේතුවෙන් ශිෂ්‍ය අවශ්‍යතා සියල්ල සපුරා නිදහස් විශිෂ්ට අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයාට උපකාර කිරීම ගුරුවරයා සතු පරම වගකීම වේ. එමෙන්ම ස්වභාවධර්මවාදයට අනුව ගුරුවරයා නිරීක්ෂකයෙක් විය යුතු අතර සෑම විටම සිසුවා පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කළ යුතු වේ (Yahya, M., Jannah, F., Basid, A., & Emas, G., 2023). ශිෂ්‍යයාට සිදු කළ යුත්තේ කුමක්ද යන්න නියම කිරීම නොවිය යුතු අතර

ශිෂ්‍යයාට තම කැමැත්ත පරිදි අධ්‍යාපනය හැදෑරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කර එහි භාවිතයන් නිරීක්ෂණය කිරීම සිදු කළ යුතුය.

එසේම දරුවන් කෙරෙහි සානුකම්පිතව හා ආදරයෙන් කටයුතු කිරීම ගුරුවරයා සතු වගකීමක් වේ. ශිෂ්‍යයාගේ හැසිරීම් සාවධානයෙන් නිරීක්ෂණය කර ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කිරීම ස්වභාවධර්මවාදී අධ්‍යාපනය ක්‍රමය යටතේ ගුරුවරයා සතු වගකීමක් ලෙස පෙන්වා දිය හැක. එසේම රූසෝ ඇතුළු සියලුම ස්වභාවධර්මවාදීන්ගේ දර්ශනයට අනුව පාසල ඉතාම නම්‍යශීලී නිදහස් පරිසරයකින් යුක්ත විය යුතුය. ශිෂ්‍ය මනසට පීඩාකාරී කිසිවක් එහි නොතිබිය යුතු අතර ශිෂ්‍යයාට තම නිදහස උපරිමයෙන් භුක්ති විඳිමින් තම අධ්‍යාපනය හැදෑරීමට හැකියාව තිබිය යුතුය (Kristiawan, 2016). සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයේ පවතින කාලසටහන භාවිතයට නොගෙන ස්වකැමැත්තෙන් අධ්‍යාපනය ලැබීම මෙයින් පුහුණු කරයි. පනවනු ලැබූ විනය මාලාවක් නොමැතිව ස්වයං විනයක් ශිෂ්‍යා තුළ පැවතිය යුතු අතර එමඟින් මනා අධ්‍යාපනයක් හැදෑරීම නිරායාසයෙන්ම සිදුවන බව ස්වභාවධර්මවාදීන්ගේ නිගමනය වේ. මෙම පාසල් ක්‍රමය යටතේ ශිෂ්‍යයන්ට පීඩාකාරී වූ විභාග පද්ධතියෙන් තොර නිදහස් අධ්‍යාපනයක් පිළිබඳ තර්කනයක් ස්වභාවධර්මවාදීන් ඉදිරිපත් කරන අතර එම ක්‍රමය යටතේ ශිෂ්‍යයින්ට දඬුවම් කිරීම හෝ පීඩාවට පත් කිරීම පිළිබඳ දැඩිව සාකච්ඡා කරනු ලැබේ. පාසල තුළ දඬුවම සම්පූර්ණයෙන්ම නවතා දැමිය යුතුය යන්න ඔවුන්ගේ අදහස වේ.

වර්තමානය වන විට මෙම ස්වභාවධර්මවාදීන්ගේ දර්ශනය භාවිත වන්නේ ඉතාමත් සුළු අවස්ථාවලදී ය. එයට හේතූන් ලෙස විද්‍යාත්මක දැනුමේ වර්ධනය සමඟ ශිෂ්‍යයින් තරඟකාරී අධ්‍යාපන රටාවකට හැඩගැසෙමින් අධ්‍යාපනය හදාරනු ලැබේ. එමඟින් ශිෂ්‍යයින් ස්වභාවදහම සමඟ පවතින සබඳතාව ක්‍රමක්‍රමයෙන් අඩු වී සාම්ප්‍රදායික පන්තිකාමරය තුළ ඔවුන්ගේ තරඟකාරි අධ්‍යාපනය හදාරනු ලැබේ. මෙම අධ්‍යාපන රටාවත් සමඟ ශිෂ්‍යයින් යාන්ත්‍රීකරණයට පත්වී ඔවුන් සතුව ඇති නිර්මාණශීලී චින්තනය ක්‍රමයෙන් අඩුවී යන බව වර්තමානයේ දාර්ශනිකයින් විසින් පෙන්වාදී ඇත (Aqidah, P., Islam, F., Ushuluddin, F., & Islam, S., 2022). එමෙන්ම රූසෝගේ

දර්ශනයට අනුව ඔහු පෙන්වාදෙන ලද දර්ශනය 21වන සියවසේ අධ්‍යාපනය තාක්ෂණික වෙනස්වීම්, ගෝලීය සංවර්ධනය සහ සමාජීය ගැටලුවලට යොමු වීම රූසෝගේ පරිසරය හා අවබෝධයෙන් සීමා වූවකි. මෙම දියුණු සමාජීය තත්ත්වය පිළිබඳ ඔහුගේ අවබෝධය අවම බැවින් එකල ඔහු යෝජනා කරනු ලද ස්වභාවධර්මවාදී දර්ශනය 21වන සියවසට ඉතා අවම ලෙස සැසඳේ. එකල පැවති නිදහස වර්තමානය වන විට නොපැවතීම හා විවිධ වූ කර්මාන්ත බිහි වීම, ගෝලීයකරණය වීම වැනි හේතූන් සමඟ ස්වභාවධර්මවාදීන් එකල පෙන්වාදුන් දර්ශනය වර්තමානය සමඟ නොසැසඳෙන බව පෙන්වා දිය හැක. කෙසේ නමුත් වර්තමාන සමාජ තත්ත්වය සමඟ ස්වභාවධර්මවාදයට අනුව අධ්‍යාපනය ලබා දීම අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්ව ඇත (Kartikasari, 2022). සමාජ ගැටලු දෙමාපිය ගැටලු හා පීඩාකාරී සමාජ තත්ත්ව සමඟ ස්වභාවධර්මය හා එක්ව කටයුතු කිරීම මඟින් මිනිස් ජීවිතවලට සහනයක් ලබා ගත හැකි බව වර්තමාන ස්වභාවධර්මවාදීන්ගේ නිගමනය වේ. මනෝවිද්‍යාත්මක ලෝකය, පරිසර විද්‍යාව ඇතුලු බොහෝ ක්ෂේත්‍රවලට ද මෙම ස්වභාවධර්මවාදයේ බලපෑම බෙහෙවින් පවතී. මෙම ක්ෂේත්‍රවල පැවැත්මට ස්වභාවධර්මවාදය ඍජුවම බලපානු ලබයි.

**සාරාංශය**

අවසාන වශයෙන් ගත් විට කිසිදු අත්භූත හෝ විශ්වාස කළ නොහැකි කිසිවක් නොව ස්වභාවධර්මය විසින් සමස්ත ලෝකයම පාලනය වන බවත් ස්වභාවධර්මය නොමැති වූ කල පැවැත්මක් නොමැති බවත් පෙන්වා දිය හැක. ස්වභාවධර්මවාදය යනු විශ්වයේ සියලු දේ, මිනිස්සුන් ඇතුළු, ස්වභාවික නීති සහ ක්‍රියාවලියන් මඟින් විස්තර කළ හැකි යැයි පවසා ඇති දර්ශනය වේ. එය අධිමානසික බලයන් යන සංකල්පය ප්‍රතික්ෂේප කර, ලෝකය තේරුම් ගැනීමට නිරීක්ෂණය, අත්දැකීම් සහ විද්‍යාත්මක දැනුම ලබා ගැනීමට ප්‍රමුඛත්වය දක්වයි. ස්වභාවධර්මවාදය තුළ මූලික අදහස නම් සියල්ලම නිරීක්ෂණය කළ හැකි අතර ඒවා ස්වභාදහමට අනුව ක්‍රියා කරන බව හා සියලු පද්ධති මිනිස් අදහස් සහ හැසිරීම් මෙම ස්වභාවික ක්‍රියාවලීන් මඟින් අවබෝධ කළ හැකි බව වේ (Kartikasari, 2022). අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි ස්වභාවධර්මවාදයේ විශාල බලපෑමක් තිබේ,

එය ස්වභාවික ලෝකය හා සෘජු අත්දැකීම් මත පදනම්ව අධ්‍යාපන ක්‍රියාවලියක් ලෙස ක්‍රියාකරනු ලැබේ. ස්වභාවධර්මවාදීන් විසින් ස්වභාවධර්මවාදය පදනම්ව අධ්‍යාපනික යෝජනා හා මනෝභාවය, විචාරකත්වය සහ විමසුම මඟින් අධ්‍යාපනය සකස් කිරීමේ වැදගත්කම පිළිබඳව අවධානය යොමුකර ඇත. එහිදී සිසුන් ස්වභාවදහම සමඟ සෘජු සම්බන්ධයක් ඇති කරමින් අත්දැකීම් සහ පරීක්ෂණය මඟින් අධ්‍යාපනය ලැබීම සිදුවේ. අත්දැකීම් මඟින් අධ්‍යාපනය මෙම ස්වභාවධර්මවාදයට ප්‍රමුඛ අදහසක් වේ. එහිදී සිසුන් අධ්‍යාපනය අක්‍රීය ලෙස නොව, සෘජු ක්‍රියාකාරීභාවයෙන් සහ සත්‍ය ක්‍රියාකාරකම් මඟින් ලබා ගනී. මෙම දර්ශනය විචාරකයින් හා ක්‍රියාකාරී අධ්‍යාපන කුසලතා ඇති දරුවන් බිහි කිරීමට විශාල දායකත්වයක් ලබා දේ. අවසාන වශයෙන්, ස්වභාවධර්මවාදය මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්වභාවය හා අත්දැකීම් මත පදනම්ව වූ අධ්‍යාපන ක්‍රමයක් යෝජනා කරයි. ලෝකය සමඟ සෘජු සම්බන්ධයකින් ක්‍රියා කර අධ්‍යාපනය පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහිත පරිපූර්ණ සිසුන් පිරිසක් නිර්මාණය කර ගැනීමට ස්වභාවධර්මවාදය මඟින් මනා රුකුලක් ලබා දෙන බව මෙමඟින් පෙන්වා දිය හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Aqidah, P., Islam, F., Ushuluddin, F., & Islam, S. (2022). *Doubts about Religion: Naturalism*. https://journal.pbnsurabaya.co.id

Kartikasari Nur, F. (2022). *Learning Theories and Schools of Education*.

Kristiawan, M. (2016). *Philosophy of Education*, The Choice is yours. Yogyakarta: Valia Pustaka.

Mesiono. (2018). *The Essence of Education in the Perspective of Analyzing the Philosophy of Education*.

Nurjannatunaimah, N., Widodo, T., & Anggriani, S. (2023). Natural Landscape of Tiris, Probolinggo Regency as an Idea for Naturalism Painting. J*oLLA: Journal of Language, Literature, and Arts*, 3(7), 1004-1021. https://doi.org/10.17977/um064v3i72023p1004-1021

Sebastian, T. (2015). *Naturalist Tactics In The Philosophy of Law: a Contribution to Philosophy of Science*. http://plato.stanford.edu/entries/

Syarif, M., & Islam, A. (2021). *Naturalism* (Materialistic and Pluralistic Naturalistic Thinking of Education).

Yahya, M., Jannah, F., Basid, A., & Emas, G. (2023). *Gold Generation Perspective of Realist-Naturalism Education.* http://Jiip.stkipyapisdompu.ac.id